# මාර්ගගත NAPLAN – දෙමාපියන් සහ භාරකරුවන් සඳහා තොරතුරු

**Sinhalese**

2019

## සිසුන් NAPLAN පරීක්ෂණ වලට පෙනීසිටින්නේ මන්ද?

ජාතික ඇගයුම් වැඩසටහන - සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව (The National Assessment Program - Literacy and Numeracy (NAPLAN)) මගින් සෑම ළමයෙකුටම පාසලේ සහ ජීවිතයේ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය කුසලතා ඇගයුම් කරනු ලැබේ.

වසර 3, 5, 7 සහ 9 සිසුන් කියවීම, ලිවීම, භාෂා සම්මතයන් (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුනු) සහ සංඛ්‍යා හැකියාව පිළිබඳ වාර්ෂික NAPLAN විභාග වලට සහභාගි වේ.

පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී ඒ ඒ ශිෂ්‍යයන් විසින් පෙන්වන කුසලතාවය පිළිබඳව දෙමාපියන්ට සහ පාසලට මෙම පරීක්ෂණ මගින් අවබෝධයක් ලබා දෙනු ලැබේ. NAPLAN පාසැලේ ඇගයුම් සහ වාර්තා ක්‍රියාපටිපාටියේ එක් අංගයක් පමණක් වන අතර එය එක් එක් ශිෂ්‍යයාගේ කුසළතා පිළිබඳව ගුරුවරුන් විසින් සවිස්තරව, අඛණ්ඩව කරනු ලබන ඇගයුම් සඳහා ආදේශනයක් නොවේ.

NAPLAN මගින් අධ්‍යාපනික වැඩසටහන් වල ක්‍රියාකාරීත්වය පිළිබඳව සහ යොවුන් ඔස්ට්‍රේලියානුවන් සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව පිළිබඳ වැදගත් ප්‍රතිඵල ලබාගන්නේද යන්න ගැන පාසැල්, අධ්‍යාපන බලධාරීන් සහ ආණ්ඩු වලට තොරතුරු සපයා දෙනු ලැබේ.

## ඇගයුම් කරනු ලබන්නේ මොනවාද?

ශිෂ්‍යයන් ඔවුන්ගේ නිත්‍ය පාසල් විෂයමාලාව හරහා ඉගෙන ගන්නා සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාවන් NAPLAN මගින් ඇගැයනු ලැබේ. NAPLAN මාතෘක සංවර්ධනය කිරීම සඳහා සියලුම රජයේ සහ රජයේ නොවන අධ්‍යාපන බලධාරීන් සම්මාදම් වී ඇත.

2019 දී බොහොමයක් සිසුන් මාර්ගගත NAPLAN විභාග වලට පෙනී සිටිනු ඇත.

සිසුන් මාර්ගගත ඇගයුම් වලට හොඳින් නියැලුන බව NAPLAN පළමු වසරේ ලැබුන ප්‍රතිපෝෂණ වලින් පෙන්නුම් කරන ලදී. මාර්ගගත NAPLAN වල එක් ප්‍රධාන වාසියක් වනුයේ ශිෂ්‍යයාට යථෝචිත (හෝ අනුවර්තීය) ආකාරයට පරීක්ෂණය ශිෂ්‍යයාගේ විභාග ප්‍රතිඵල වලට ඉබේම අනුවර්තනය වීමයි. ශිෂ්‍යයාගේ සාධන මට්ටමට අනුව, පරීක්ෂණයේදී සංකීර්ණත්වයෙන් වැඩි හෝ අඩු ප්‍රශ්න ලබා දෙනු ලැබේ.

යථෝචිත (හෝ අනුවර්තීය) පරීක්ෂණ සැලසුම් කර ඇත්තේ එමගින් සිසුන්ගේ සාධන මට්ටම් පුළුල් පරාසයක් වඩාත් නියත ලෙස මැනීම සඳහාය. තමාට සුපුරුදු පමණට වඩා මෙම ප්‍රශ්න අභියෝගාත්මක ලෙස පෙනුණද ඔබේ ළමයා ඒ ගැන සිත කලබල විය යුතු නැත ඒ ඔවුන් වඩාත් සංකීර්ණ පරීක්ෂණ මාර්ගයක් ගන්නා නිසා විය හැකිය. ශිෂ්‍යයකුගේ සමස්ත NAPLAN ලකුණු පාදක වනුයේ ඔවුන් නිවැරදිව උත්තර දුන් ප්‍රශ්න ගණන සහ ඒවායේ සංකීර්ණත්වය මතය.

මාර්ගගත NAPLAN යතුරුපුවරු හැකියා පිළිබඳ විභාගයක් නොවේ. ශිෂ්‍යයෙකුට කොපමන වේගයෙන් සහ කොපමන හොඳින් අතින් අකුරු ලිවිය හැකිද යන්න ගැන වෙනස්කම් තිබෙන්නා සේම, ශිෂ්‍යයෙකුට කොපමන වේගයෙන් සහ කොපමන හොඳින් යතුරු ලියනය කළ හැකිද යන්නෙහිද වෙනස්කම් තිබේ. 3 වසරේ සිසුන් ලිවීමේ විභාගය මුද්‍රිතව සම්පූර්ණ කරනු ඇත.

මාර්ගගත ඇගයුම ගැන අවබෝධයක් ලබාගැනීම පිණිස **nap.edu.au** පොදු ආදර්ශක වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## මගේ ළමයාට මීට සූදානම් වීමට මට උදව් කල හැක්කේ කෙසේද?

NAPLAN යනු තම පාසල් වැඩසටහනේම එක් කොටසක් බව යලි තහවුරු කර දීම සහ පරීක්ෂණ දවසේදී තමන්ට හැකි උපරිම අන්දමට එම කාර්යයට උත්සාහ කරන ලෙස මතක් කරදීම මගින් ඔබේ ළමයාට මීට සූදානම් වීමට උපකාරී වන්න. සිසුන්ට විභාග වලදී ලැබෙන ප්‍රශ්න වල මාදිලිය ගැන හුරුපුරුදු බව ලබා දීමටත්, ඔවුනට නිසි උදව් සහ මගපෙන්වීම් සැපයීමටත් ගුරුවරු සහතික වෙති. උපකරණ පාවිච්චි කරන අන්දම සහ එමගින් යතුරු ලියනය කිරීම සහ ක්‍රමලේඛ හැසිරවීම ගැන පාසලේ පළමු වසරේ සිටම සිසුන්ට හුරුපුරුද්දක් ලබාදීම ඔස්ට්‍රේලියානු විෂයමාලාවේ අංගයක් මෙන්ම අවශ්‍යතාවයකි.

NAPLAN සඳහා උවමනාවට වඩා සූදානම් වීම හෝ පුහුණු කරුවන්ගෙ සේවය ලබාගැනීම ACARA විසින් නිර්දේශ කරනු නොලැබේ. NAPLAN හි අරමුණ සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාවි ප්‍රගතිය ඇගයුමට ලක් කිරීමයි.

## මගේ ළමයා NAPLAN සඳහා මුහුණ දෙන්නේ මුද්‍රිතවද මාර්ගගතවද?

2019 දී ඔබේ ළමයා NAPLAN මාර්ගගත විභාග වලට මුහුණ දෙනු ඇත. එහෙත් ඔස්ට්‍රේලියාව වටා සමහර පාසල් වල සිසුන් මේ වසරේදී NAPLAN මුද්‍රිත විභාගයට මුහුණ දෙනු ඇත. සියලුම පාසල් 2020 වන විට මාර්ගගත කිරීමට ෆෙඩරල්, ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ වල අධ්‍යාපන ඇමතිවරු එකග වූහ. තම පාසල් මාර්ගගත භාවිතයට මාරුවන්නේ කවදාද යන්න එක් එක් ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවල අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරණු ඇත.

සිසුන් විභාගයට මුහුණ දෙන්නේ මාර්ගගතව හෝ මුද්‍රිතව වුවද ඔවුන්ව එකම සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව විෂයමාලා අන්තර් ගතයක් ගැන ඇගයුමට ලක් කරන බැවින්, මෙම ආකෘති දෙකෙහිම ප්‍රතිඵල එකම NAPLAN ඇගයුම් පරිමාණයක් මත වාර්තා කළ හැකිය. මාර්ගගත NAPLAN ගැන වැඩිදුර සොයා ගැනීමට **nap.edu.au** වෙත යන්න.

NAP NATIONAL ASSESSMENT PROGRAM

acara AUSTRALIAN CURRICULUM, ASSESSMENT AND REPORTING AUTHORITY

## NAPLAN සඳහා සහභාගී වීම

වසර 3, 5, 7 සහ 9 සියලුම සිසුන් වාර්ෂික NAPLAN ඇගයුම් වලට සහභාගී වීම අපේක්ෂිතය.

ආබාධිත සහිත සිසුන්ට පන්ති කාමරයේ ඇගයුම් වලදී සාමාන්‍යයෙන් සැපයෙන උපකාර පිළිබිඹු වන විශේෂ විධිවිධාන ලබා ගැනීමට සුදුසුකම් ලබා ගැනීමට පුලුවන. ඔබේ ළමයා සඳහා යම් ආබාධ විධිවිධාන ලබාදීම ගැන ළමයාගේ ගුරුවරයා සමග ඔබ පලමුවෙන් සාකච්චා කල යුතුය.

ඇගයුම් සඳහා සහභාගි වීමේ හැකියාව දැඩි ලෙස සීමා කරණ ආබාධතා සහිත, හෝ මෑතකදී ඔස්ට්‍රේලියාවට පැමිණි ඉංග්‍රීසි කතා නොකරන පසුබිමක් සහිත සිසුන්ට මෙම ඇගයුමෙන් විධිමත් නිදහස් කිරීමක් ලබා ගත හැකිය.

විශේෂ විධිවිධාන ගැන හෝ විධිමත් නිදහස් කිරිමක් ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය ගැන වැඩිදුර විස්තර ඔබේ පාසලේ විදුහල්පතිගෙන් සහ ඔබේ ප්‍රදේශයේ පරීක්ෂණ පරිපාලණ අධිකාරයෙන් ඔබට ලබා ගැනීමට පුළුවන.

## මාර්ගගත NAPLAN 2019 පරීක්ෂණ කාල සටහන

මාර්ගගත NAPLAN සඳහා වන විභාග කාලසීමාව මුද්‍රණ පාදක විභාගය සඳහා දින තුනක සිට දින නමයක් දක්වාද දීර්ග කර ඇත. මෙසේ කර ඇත්තේ උපකරන අඩු පාසල් වලට වඩාත් නම්‍ය ලෙස විභාග දින නියම කරගැනීම පහසුවන පිණිසය. මාර්ගගත NAPLAN ඇගයුම් කාල සීමාව මැයි 14 වන අඟහරුවාදා දින පටන්ගෙන 2019 මැයි 24 වන සිකුරාදා දින අවසන්වේ.

මාර්ගගත පරීක්ෂණ සඳහා පහත පෙනෙන අනු පිලිවෙලට පෙනී සිටිය යුතුය.

| පරීක්ෂණය | කාලසීමාව | අනුපිළිවෙළ | විස්තර |
|---|---|---|---|
| ලිවීම | 3 වසරː මිනිත්තු 40<br>5 වසරː මිනිත්තු 40<br>7 වසරː මිනිත්තු 40<br>9 වසරː මිනිත්තු 40 | මුල් දින දෙක තුලදී සම්පූර්ණ කල යුතුය | 3 වසර සිසුන් පළමු දිනයේ පමනක් මුද්‍රිත-පාදක ලිවීමේ විභාගයට සහභාගි වනු ඇත |
| කියවීම | 3 වසරː මිනිත්තු 45<br>5 වසරː මිනිත්තු 50<br>7 වසරː මිනිත්තු 65<br>9 වසරː මිනිත්තු 65 | ලිවීම පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | තොරතුරු දක්වන, චිත්තෝත්පාදක සහ එක්තු ගන්වන සුළු පාඨ පරාසයක් සිසුන් විසින් කියවනු ඇත |
| භාෂා සම්මතයන් | 3 වසරː මිනිත්තු 45<br>5 වසරː මිනිත්තු 45<br>7 වසරː මිනිත්තු 45<br>9 වසරː මිනිත්තු 45 | කියවීම පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | මෙම විභාගයට අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණය සහ විරාම ලකුණු අඩංගු වේ |
| සංඛ්‍යා හැකියාව | 3 වසරː මිනිත්තු 45<br>5 වසරː මිනිත්තු 50<br>7 වසරː මිනිත්තු 65<br>9 වසරː මිනිත්තු 65 | භාෂා සම්මතයන් පරීක්ෂණයට පසු සම්පූර්ණ කල යුතුය | මෙම විභාගයට සංඛ්‍යා සහ වීජ ගණිතයෙ මිනුම සහ ජ්‍යාමිතියෙ සහ සංඛ්‍යානය සහ සම්භාවිතාව අඩංගු වේ |

## ඇගයුම් පවත්වන දිනවල මගේ ළමයා පාසැලට නොපැමිණිය හොත් කුමක් සිදුවේද?

පරීක්ෂණ පවත්වන අවස්ථාවේ පාසැලට නොපැමිණි සිසුන් සඳහා පාසලේ පරීක්ෂණ පැවැත්වෙන කාල සීමාව තුළදී වෙන වේලාවක එම මගහැරුනු පරීක්ෂණ නිම කිරීමට පාසැල විසින් හැකි සෑම විටකම කටයුතු සලසනු ඇත. 2019 මැයි 24 වන සිකුරාදා දිනයෙන් පසුව මාර්ගගත NAPLAN පරීක්ෂණ වලට පෙනී සිටීමට සිසුන්ට අවසර නැත.

## මගේ ළමයාගේ කාර්ය සාධනය මනින්නේ කෙසේද?

එක් එක් පරීක්ෂණයේදී යම් ශිෂ්‍යයෙක් විසින් පෙන්වන ලද කුසළතා ජාතික සාධන පරිමාණයක් මගින් පෙන්නුම් කරනු ලැබේ. ජාතික අවම ප්‍රමිතියක ප්‍රතිඵලයකින් පෙන්වා දෙන්නේ සිසුවා එම වසර මට්ටමේ සහභාගිවීමට අවශ්‍යවන මූලික සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා නිපුණතා පෙන්නුම් කර ඇති බවයි.

වසරේ පසු දවසක NAPLAN පුද්ගලික වාර්තාවක් ඔබේ ළමයාගේ පාසල පාසල විසින් නිකුත් කරනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුනොත් ඔබ ඒ ගැන ළමයාගේ පාසල අමතන්න.

## NAPLAN ප්‍රතිඵල ප්‍රයෝජනයට ගන්නේ කිනම් ආකාරයටද?

- ගුරුවරු සමග ප්‍රගතිය සාකච්ජා කිරීම සඳහා සිසුන්ට සහ දෙමාපියන්ට පුද්ගලික ප්‍රතිඵල උපයෝගී කරගත හැකිය.
- වැඩිතර අභියෝග හෝ අමතර ආධාර තුලින් උපකාරී විය හැකි සිසුන්ව වඩා හොඳින් හඳුනාගැනීම සඳහා ගුරුවරු මෙම ප්‍රතිඵල උපයෝගී කරගනී.
- ඉගැන්වීම් වැඩ සටහන්වල ශක්තීන් සහ දුර්වලකම් හඳුනාගැනීම සඳහාත් සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා පිළිබඳ ඉලක්ක සැකසීම සඳහාත් පාසැල් විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- වැඩ සටහන් සහ පාසැල් වලට සපයනු ලබන ආධාර සමාලෝචනය කිරීම පිණිස පාසැල් පද්ධති විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- පාසල් NAPLAN ප්‍රතිඵල වල සාමාන්‍යය **myschool.edu.au** වෙතින් ප්‍රජාවට බලාගත හැකිය.

## මට වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොතැනින්ද?

NAPLAN ගැන වැඩිදුර තොරතුරු සඳහාː

- ඔබේ ළමයාගේ පාසැල අමතන්න
- ඔබේ ප්‍රදේශයේ විභාග පරිපාලන අධිකාරිය අමතන්න **nap.edu.au/TAA**
- **nap.edu.au** වෙත යන්න

NAPLAN පිළිබඳ පෞද්ගලික තොරතුරු ACARA විසින් පාවිච්චි කරනු ලබන අන්දම ගැන තොරතුරු සඳහා **nap.edu.au/naplanprivacy**